පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
**8**

# දෙවන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ...................................................
.........................................................................................................

කාලය : පැය 02 යි.

# පුරවැසි අධ්‍යාපනය I, II

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ සේවාවකි.
   (1) නිදහස් අධ්‍යාපන සේවාව (2) බැංකු සේවාව
   (3) ආරක්ෂක සේවාව (4) සමූපකාර සේවා

02. නිදහස් අධ්‍යාපනයට අදාළ යෝජනා සම්මත වූයේ කුමන වර්ෂයේදී ද?
   (1) ක්‍රි. ව. 1943 (2) ක්‍රි. ව. 1945
   (3) ක්‍රි. ව. 1946 (4) ක්‍රි. ව. 1954

03. සෞඛ්‍ය සේවය මඟින් ඉටුකරන කාර්යයකි.
   (1) රටේ පරිපාලන කටයුතු පහසු කිරීම (2) යහපත් පුරවැසියන් බිහි කිරීම
   (3) දුරකථන පහසුකම් සැපයීම (4) මාතෘ සායන පැවැත්වීම

04. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය,
   (1) පූර්විකාවකින් හා වගන්ති 54 කින් සමන්විත ය.
   (2) පූර්විකාවකින් හා වගන්ති 58 කින් සමන්විත ය.
   (3) පූර්විකාවකින් හා වගන්ති 64 කින් යුක්ත ය.
   (4) පූර්විකාවකින් හා වගන්ති 45 කින් යුක්ත ය.

05. ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලියක් නොවන්නේ,
   (1) ජනතාව සමඟ ඉතා සමීපව කටයුතු කිරීම (2) ප්‍රශ්නවලට සවන්දීම හා ප්‍රශ්න විසඳීම
   (3) ජනතා ශුභ සිද්ධියට කටයුතු නොකිරීම (4) ජනතා අදහස් පිළිගැනීම හා ගරු කිරීම

Education NCP - www.edncp.lk

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා ඇති ප්‍රකාශ සඳහා හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06. දීපවාලි උත්සවය හින්දු ආගම හා බැඳුණු ප්‍රධාන සංස්කෘතික උත්සවයකි. ( )

07. ඩෙංගු උවදුර ස්වාභාවික විපතකි. ( )

08. මිතුරු සබඳතා පැවැත්වීම ළමා අයිතිවාසිකමකි. ( )

09. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ආයතනයකි. ( )

10. පාස්කු උත්සවය හින්දු ආගම හා බැඳුණු ප්‍රධාන සංස්කෘතික උත්සවයකි. ( )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ඇති (අ) කොටසේ ප්‍රශ්නවලට අදාළ පිළිතුර (ආ) කොටසින් තෝරා ඉදිරියේ ඇති වරහන තුළ අක්ෂරය යොදන්න.**

| | (අ) | | | (ආ) |
|---|---|---|---|---|
| 11. | පෘථිවි අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලියකි. | ( ) | (a) | ලානිනෝ |
| 12. | කාලගුණික හා දේශගුණික විපර්යාසයකි. | ( ) | (b) | හජ්ජි උත්සවය |
| 13. | ඉස්ලාම් ආගම හා බැඳුණු ප්‍රධාන සංස්කෘතික උත්සවයකි. | ( ) | (c) | නත්තල් උත්සවය |
| 14. | ක්‍රිස්තියානි ආගමික උත්සවයකි. | ( ) | (d) | රාමසාන් උත්සවය |
| 15. | ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්තයකි. | ( ) | (e) | මොන්ටානා |
| | | | (f) | භූ චලන |

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රකාශනවල හිස්තැනට සුදුසු වචන පහත වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(1959 / 1991 / 1984 / දූෂිත / ඒකාධිපති / නාමික / ප්‍රජාතන්ත්‍රවාදී)

16. තර්ජනය කිරීම, බිය ගැන්වීම .............................................. නායකත්ව ශෛලියට ගැනේ.

17. සොරකම්, වංචා දූෂණ කටයුතුවල නියැලීම .............................................. නායකත්ව ශෛලියකි.

18. තමා කැපී පෙනීමට උත්සාහ දැරීම .............................................. නායකත්ව ශෛලියකි.

19. ශ්‍රී ලංකා ජාතික රෝහල් තොරතුරු කේන්ද්‍රයේ කෙටි දුරකථන අංකය .............................................. වේ.

20. පරිසරයට හා ස්වාභාවික සම්පත් ආශ්‍රිත පැමිණිලි කරනු ලබන කෙටි දුරකථන අංකය .............................................. වේ.

(ලකුණු 2 × 20 = 40)

Education NCP - www.edncp.lk

# පුරවැසි අධ්‍යාපනය II

❖ **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) පොදු සේවා මහජනතාව වෙත සපයන ආකාරය අනුව වර්ග කර දක්වන්න. (ලකුණු 03)
(ii) පොදු සේවාවක් ලෙස පානීය ජලය සැපයීම අවශ්‍ය වීමට හේතු 04 ක් ලියන්න. (ලකුණු 04)
(iii) අධ්‍යාපනය මඟින් ඉටුකරන කාර්යයන් 05 ක් ලියා දක්වන්න. (ලකුණු 05)

02. (i) පොදු ප්‍රවාහන සේවා කාර්යක්‍ෂම කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර 03 ක් ලියන්න. (ලකුණු 03)
(ii) තැපැල් සේවය මඟින් ජනතාවට සැපයෙන සේවාවන් 04 ක් ලියන්න. (ලකුණු 04)
(iii) පරිසර සංරක්‍ෂණය සඳහා රජය මඟින් පිහිටුවා ඇති ආයතන 05 ක් සඳහන් කරන්න. (ලකුණු 05)

03. (i) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්‍ෂණ 03 ක් ලියා දක්වන්න. (ලකුණු 03)
(ii) ළමා යුතුකම් 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)
(iii) අයහපත් චිත්තවේග සමනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 05 ක් ලියන්න. (ලකුණු 05)

04. (i) බහු සංස්කෘතික සමාජයක ජීවත්වීමේ දී අප විසින් අනුගමනය කළ යුතු ගුණාංග 03 ක් ලියා දක්වන්න. (ලකුණු 03)
(ii) බහු සංස්කෘතික ජන සමාජයක ලක්‍ෂණ 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)
(iii) ජාතික සමගිය හා තිරසර සාමය ගොඩ නගා ගැනීමේ වාසි 05 ක් ලියන්න. (ලකුණු 05)

05. (i) ස්වාභාවික විපත් 03 ක් ලියන්න. (ලකුණු 03)
(ii) ගංවතුර ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් 04 ක් ලියා දක්වන්න. (ලකුණු 04)
(iii) සුළි සුළං පවතින විට ආරක්‍ෂාව සඳහා කළ යුතු කාර්යයන් 05 ක් ලියන්න. (ලකුණු 05)

06. (i) අනතුරු හා ආපදාවලදී සහාය ලබාගත හැකි ආයතන 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
(ii) ඖෂධ භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් ලියන්න. (ලකුණු 04)
(iii) මහා මාර්ගයේ දී රියදුරන් අතින් සිදුවන වැරදි 05 ක් ලියන්න. (ලකුණු 05)

07. (i) ළමා අයිතිවාසිකම් ආරක්‍ෂා කරදීමට ක්‍රියාත්මක වන ආයතන 03 ක් ලියන්න. (ලකුණු 03)
(ii) ළමා අයිතිවාසිකම් 04 ක් ලියා දක්වන්න. (ලකුණු 04)
(iii) නායකයකු සතු විය යුතු ගුණාංග 05 ක් සඳහන් කරන්න. (ලකුණු 05)

***



Education NCP - www.edncp.lk

## පුරවැසි අධ්‍යාපනය I
## ලකුණු දීමේ පටිපාටිය

| | |
|---|---|
| 01 | (2) |
| 02 | (1) |
| 03 | (4) |
| 04 | (1) |
| 05 | (3) |
| 06 | ✓ |
| 07 | × |
| 08 | ✓ |
| 09 | ✓ |
| 10 | × |
| 11 | f |
| 12 | a |
| 13 | b |
| 14 | c |
| 15 | e |
| 16 | ඒකාධිපති |
| 17 | දූෂිත |
| 18 | නාමික |
| 19 | 1959 |
| 20 | 1991 |

# පුරවැසි අධ්‍යාපනය II

## ලකුණු දීමේ පටිපාටිය

01. (i) ★ නොමිලේ සපයන පොදු සේවා
★ සහනදායි අය කිරීමේ පදනම මත සපයන පොදු සේවා
★ මුදල් අයකර සපයන පොදු සේවා

(ii) ★ දිවයිනේ සෑම ප්‍රදේශයකට අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් තරමට ජල සම්පත සුලභ නොවීම.
★ වියළි කාලවල දී විවිධ ප්‍රදේශ ජල හිඟයකට මුහුණපෑම.
★ නගර බද ප්‍රදේශවල ජන සංඛ්‍යාව අධික වීම.
★ භූගත ජලය හා ගංගා ජලය විවිධ හේතුකාරක නිසා අපවිත්‍ර වීම.

(iii) ★ නව දැනුම ලබා දීම.
★ සමාජානුයෝජනය කිරීම.
★ යහපත් පුරවැසියන් බිහි කිරීම. (පිටු අංක 14)

02. (i) ★ අධිවේගී මාර්ග ඉදි කිරීම.
★ නව බස්රථ ධාවනයට එක් කිරීම.
★ මඟී ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීතිමය පියවර ගැනීම. (පිටු අංක 17)

(ii) ★ මුද්දර විකිණීම.
★ ටෙලිමේල් පහසුකම්.
★ දුරකථන පහසුකම්. (පිටු අංක 20)

(iii) ★ පරිසර අමාත්‍යංශය
★ මධ්‍යම පරිසර අධිකාරිය
★ වනජීවී දෙපාර්තමේන්තුව

03. (i) ★ සාකච්ඡා මඟින් නිවැරදි තීරණ වලට එළඹීම.
★ නායකත්වයට ගරු කිරීම.
★ සහයෝගයෙන් කටයුතු කිරීම. (පිටු අංක 38)

(ii) ★ හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරත වීම.
★ ගුරු දෙගුරුන්ට ගෞරව කිරීම.
★ පෞද්ගලික සෞඛ්‍ය පිළබඳ දැනුවත් වීම.
★ සත්‍ය කරුණු ප්‍රකාශ කිරීම. (පිටු අංක 40)

(iii) ★ මනස සන්සුන් කිරීමේ අභ්‍යාස
★ මිතුරන් ඇසුරු කිරීම
★ නිර්මාණකරණය සඳහා යොමු වීම (පිටු අංක 44 - 45)

04. (i) ★ සෑම ජනවර්ගයකට අයත් පුද්ගලයන්ට ගරු කිරීම.
★ තම යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීම.
★ සෑම ජනවර්ගයකට අයත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. (පිටු අංක 58)

(ii) ★ විවිධ ජනවර්ග ජීවත් වීම.
★ විවිධ ආගම් අදහනු ලබන ජන කොටස් ජීවත් වීම.
★ විවිධ භාෂා කතා කරන ජන කොටස් ජීවත් වීම. (පිටු අංක 59, 60, 61)

(iii) ★ එකිනෙකා අතර අවබෝධය ඇති වී විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම නිසා ගැටුම් අවම වේ.
★ ජන කොටස් අතර සමගිය තහවුරු වේ.
★ රට සංවර්ධනය කිරීම සඳහා සියලු දෙනාගේ දායකත්වය ලැබේ. (පිටු අංක 72)

05. (i) ★ ගංවතුර
★ නියඟ
★ අකුණු (පිටු අංක 75)

(ii) ★ වනාන්තර විනාශ කිරීම.
★ වගුරු බිම් ගොඩ කිරීම.
★ පතල් කැණීම. (පිටු අංක 76)

(iii) ★ අනතුරු සහිත ප්‍රදේශවලින් ඉවත් වීම.
★ ආරක්ෂිත ස්ථාන කරා යෑම.
★ සැහැල්ලු හා අත්‍යවශ්‍ය දෑ පමණක් රැගෙන යාම.
★ විදුලිය විසන්ධි කිරීම.
★ නිවසට හානි ගෙන දෙන ගස් හා අතු කපා ඉවත් කිරීම. (පිටු අංක 78)

06. (i) ★ රෝහල
★ පොලීසිය
★ ගිනි නිවන ඒකකය (පිටු අංක 83)

(ii) ★ නියමිත වෛද්‍ය උපදෙස් පිළිපැදීම.
★ ඖෂධවල නියමිත මාත්‍රාව භාවිතා කිරීම.
★ නියමිත වේලාවට ඖෂධ භාවිතා කිරීම. (පිටු අංක 89, 90)

(iii) ★ බීමත්ව රිය පැදවීම.
★ අධික වේගයෙන් රිය පැදවීම.
★ වැඩිපුර මගීන් රැගෙන යාම. (පිටු අංක 94)

07. (i)
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.
- පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව.
- ළමා හා කාන්තා කාර්යාංශය, ශ්‍රී ලංකා පොලීසිය.

(ii)
- අධ්‍යාපනය ලැබීම.
- සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම.
- නිදහස් අදහස් ප්‍රකාශ කිරීම.
- නිසි රැකවරණය ලැබීම. (පිටු අංක 40)

(iii)
- සන්නිවේදන හැකියාව
- ගැටලු විසඳීමේ හැකියාව
- මෙහෙය වීමේ හැකියාව
- මානව සම්බන්ධතා
- ආවේදනීය හැකියාව

***